

## පසුබිම

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය ඉතා අඩු වේ. එය හුදෙක් 5.3% ක් වන අතර, මන්ත්‍රීවරුන් 225 න් 12 ක් පමණක් කාන්තාවන් වේ. ශ්‍රී ලංකාවේ කාන්තාවන් දේශපාලන නියෝජනයේදී සැලකිය යුතු බාධාවලට මුහුණ දෙන අතර, ජාතික ව්‍යවස්ථාදායකයන්හි කාන්තා ප්‍රතිශතය අනුව ශ්‍රී ලංකාව ගෝලීය වශයෙන් පහළම ස්ථානයක ඇත. එබැවින්, දේශපාලනයේ කාන්තා නියෝජනය අඩුවීම පිළිබඳ ගැටළුව විසඳීම සඳහා ඉලක්කගත ක්‍රියාමාර්ග අවශ්‍ය වේ.

# දේශපාලනය සඳහා කාන්තාවන්

# ශ්‍රී ලංකාව

## පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ (WPC) නිර්දේශ

ශ්‍රී ලංකාවේ 9 වැනි පාර්ලිමේන්තුව - 2023 දෙසැම්බර්

### 1

### ජාතික ලැයිස්තුව

ජාතික ලැයිස්තුවෙන් 50%ක් විවිධ වෘත්තීන්හි යෙදෙන කාන්තාවන් බව සහතික කරන්න. ඉහළම අපේක්ෂකයන් දෙදෙනා ස්ත්‍රී සහ පුරුෂ විය යුතුය - එතැන්සිට සිග්සැග් ක්‍රමය භාවිතා කරන්න.

### 2

### නාමයෝජනා ලැයිස්තුව

අපේක්ෂකයින් සඳහා වන නාමයෝජනා ලැයිස්තුවෙන් අවම වශයෙන් 30% ක් කාන්තාවන් බව සහතික කරන්න.

### 3

### සංවෘත පක්ෂ ලැයිස්තු

මැතිවරණයෙන් පසු ජාතික ලැයිස්තුවේ අපේක්ෂකයින් වෙනස් නොකළ යුතුය.

### 4

### සම නායකත්ව ආකෘතිය

සෑම පක්ෂයක් සඳහාම පිරිමි සහ කාන්තා සම නායකයින් පත් කරන්න.

### 5

### කෝටාවන්

පිරිමින්ට සහ කාන්තාවන්ට තරඟ කිරීමට සමාන අවස්ථා නිර්මාණය වන තෙක් කාන්තාවන් සඳහා 25% ක තාවකාලික කෝටාවක් හඳුන්වා දෙන්න. සියළුම පක්ෂ ස්වේච්ඡාවෙන් තම තීරණ ගැනීමේ ව්‍යුහ සඳහා අවම වශයෙන් 33% කාන්තාවන් පත් කළ යුතුය.

### 6

### SGBV

ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට (SGBV) එරෙහිව කිසිසේත් නොඉවසීමේ (ZERO TOLERANCE) ප්‍රතිපත්තියක් පවත්වා ගන්න.

### 7

### මැතිවරණ ප්‍රතිසංස්කරණ

නවසීලන්ත ආකෘතිය සුදුසු පරිදි අනුගමනය කරමින් මැතිවරණ ක්‍රමය ප්‍රතිසංස්කරණය කරන්න. නීති මගින් පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය අවම වශයෙන් 25% සහ පක්ෂ ව්‍යුහය තුළ තීරණ ගැනීමේ ආයතනවල කාන්තාවන් 1/3 ක් අනිවාර්ය කළ යුතුය.